සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2015

# කතෝලික ධර්මය

**11 ශ්‍රේණිය** **කාලය පැය 3 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. එදිනෙදා ජීවිතයේ දී අපට මුහුණ දීමට සිදුවන කම්කටොළු,
   (1) දේව දඬුවමකි. (2) දේව පණිවුඩයකි.
   (3) පාපයේ විපාකයකි. (4) ජන්ම පාපයේ ප්‍රතිඵලයකි.

02. නිවැරදි දේ තෝරා ගැනීමටත් අයහපත පිටු දැකීමටත් අපට උපකාරී වන්නේ,
   (1) හෘද සාක්ෂියය. (2) මිනිස් බුද්ධියය. (3) වැඩිහිටි අවවාදය. (4) නිදහස් කැමැත්තය.

03. අද ලොව පුරා පවතින විවිධ විනාශකාරී ක්‍රියාවන්ට හේතුව වන්නේ,
   (1) තමා සෑම විටම නිවැරදි යැයි සිතන නිසාය.
   (2) අසීමිත ලෙස ධනයට හා බලයට වහල් වීමය.
   (3) මිනිසා දෙවියන් වහන්සේගේ සැලැස්මට පිටු පෑමය.
   (4) නවීන විද්‍යාත්මක හා තාක්ෂණික දැනුමට මුල් තැන දීමය.

04. ''සත්‍යතාවයේ ආත්මයාණන් පැමිණි කල පූර්ණ සත්‍ය කරා යාමට මඟ පෙන්වන සේක.'' මෙම දේව ප්‍රකාශය ඔබ ජීවිතය තුළ යථාර්ථයක් කරගත හැකි වනුයේ,
   (1) සෑම අවස්ථාවකදීම සත්‍යය ප්‍රකාශ කිරීමෙනි. (2) සෑම අවස්ථාවකදීම අසත්‍යය හෙළා දැකීමෙනි.
   (3) සෑම අවස්ථාවකදීම සත්‍ය අගය කිරීමෙනි. (4) සෑම අවස්ථාවකදීම සත්‍යවාදීව ජීවත් වීමෙනි.

05. 6 වන සහ 9 වන පණත් වලින් අපට නියම වන්නේ,
   (1) සිත, කය හා වචනයේ පිවිතුරුකමට විරුද්ධ දෙයින් වැළැකීමටය.
   (2) ශරීරයේ පාරිශුද්ධිය කෙලෙසන දෙයින් වැළැකීමටය.
   (3) සිත හා මනස අපිරිසිදුවන දෙයින් වැළකී සිටීමටය.
   (4) දූෂණ හා අක්‍රමිකතාවලින් වැළකී සිටීමටය.

06. අලුත් අහස් හා පොළොවක් නිර්මාණය වන විට අපගේ වගකීම වන්නේ,
   (1) ශුද්ධාත්මයාණන් මගින් සෑම දෙනාම නව මැවිල්ලක් බවට පත්වීමට සහාය වීමය.
   (2) ස්වාමීන් වහන්සේගේ වාසභවනය මිනිසුන් අතරේ පැවතීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීමය.
   (3) එකම බැටලු රැලක්ද එකම එඬේරෙක්ද වන ලෙස මානව වර්ගයා එක්සත් කිරීමය.
   (4) නපුරේ සියලු ක්‍රියාකාරීත්වයන් අහෝසි කරන මනා බලවේගයක් දියත් කිරීමය.

07. දිවැසිවරයාගේ කාර්ය භාරය වන්නේ,
   (1) දේව ක්‍රියාකාරීත්වය විස්තර කිරීමය. (2) නොමඟ යන ජනතාවට දඬුවම් කිරීමය.
   (3) දෙවියන් වහන්සේ වෙනුවෙන් කතා කිරීමය. (4) රාජ්‍ය පාලකයන්ට මඟ පෙන්වීමය.

08. ජේසුස් වහන්සේ පියාණන් වහන්සේ තුළ ක්‍රියා කරන ආකාරය ජනතාවට පෙන්වා දුන් ප්‍රාතිහාර්යය වන්නේ,
   (1) පන්දහසකට කෑම දීමය. (2) කුණාටුව සන්සිඳුවීමය.
   (3) අන්ධයා සුවපත් කිරීමය. (4) ලාසරස් උත්ථාන කිරීමය.

09. ගැලවුම්කාරයාණන්ට මෙසියස් යන නම ලැබුණේ,
   (1) අභිෂේක ලත් තැනැත්තා වූ නිසාය. (2) දිළිඳුව උපන් නිසාය.
   (3) කන්‍යාවකගෙන් උපන් නිසාය. (4) ප්‍රාතිහාර්යයන් සිදුකළ නිසාය.

10. ස්නාවක ජොහාන් තුමාගේ විශේෂත්වය වන්නේ,
   (1) ඔහු ජේසුස් වහන්සේට ඇද නැති මාවතක් සකස් කිරීමය.
   (2) ඔහු මව් කුස සිටියදීම ශුද්ධාත්මයාණන් ගෙන් පූර්ණ වීමය.
   (3) ඔහු පාලුකරයේ දී ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වීමය.
   (4) ඔහු ජේසු සමිඳුන්ට ජොර්දාන් ගඟේ දී ස්නාපනය ලබා දීමය.

11. ස්වාමිවාක් ආරාධනාවේ අඩංගු යාච්ඤාමය ගුණාංගයක් නොවන්නේ,
   (1) සමිඳුන්ට ප්‍රශංසා කිරීම (2) දේව මනස්කාරය
   (3) දේව ආරක්ෂාවට භාර වීම (4) සාමය ඉල්ලීම

12. මනුෂ්‍ය ශරීරය දේව මාලිගයක් බවට පත්වන්නේ,
   (1) අභිවෘද්ධි ආලේපයෙනි (2) දිව්‍ය සත්ප්‍රසාදයෙනි
   (3) ප්‍රසාද ස්නාපනයෙනි (4) පූජකවරයෙනි

13. උත්තම පූජක යාච්ඤාව හඳුන්වන වෙනත් නමක් වන්නේ,
   (1) ශ්‍රාවකයින් සඳහා යැදුම (2) ස්වාමිවාක් ආරාධනාව
   (3) විශ්වාස ලක්ෂණය (4) මංගල්‍ය ආරාධනාව

14. උත්තම පූජක යාච්ඤාව සඳහන්ව ඇති සුභාරංචිය වන්නේ,
   (1) ශුද්ධ වූ මාක් තුමාගේ සුභාරංචිය (2) ශුද්ධ වූ ජොහාන් තුමාගේ සුභාරංචිය
   (3) ශුද්ධ වූ මතෙව් තුමාගේ සුභාරංචිය (4) ශුද්ධ වූ ලූක් තුමාගේ සුභාරංචිය

15. ඔබට පැවිදි හෝ පූජක ජිවිතය සඳහා කැඳවීමක් ඇතැයි සිතන්නේ නම් ඔබ කළ යුතු ප්‍රධානතම කාර්යය වන්නේ,
   (1) මීසම භාර පූජා ප්‍රසාදිතුමා හමුවී ඒ බව පැවසීම ය.
   (2) දෙමාපියන් සමඟ ඒ ගැන සාකච්ඡා කිරීමය.
   (3) එම කැඳවීම හා සම්බන්ධ නිකායන් ගැන සොයා බැලීමය.
   (4) දේව කැමැත්ත තෝරාගැනීම සඳහා යාච්ඤා කිරීමය.

16. ''තම පූජාසනයේ පඬුරු පුදන විට ඔබේ සහෝදරයාට .................... යම්කිසි .................... ඇතිව සිටින බව එහිදී සිහිවී නම් පඬුරු පූජාසනය ඉදිරියේ තාබ ගොස් පළමු කොට සහෝදරයා හා සමගි වී පඬුරු පුදන්න.'' මෙහි හිස්තැනට යෝග්‍ය වනුයේ,
   (1) කැමැතිව, අසමගියක් (2) අකැමැතිව, තරහවක්
   (3) විරුද්ධව, අමනාපයක් (4) නොසතුටුව, වෛරයක්

17. ජේසුස් වහන්සේගේ ධර්මදූත කාර්යයේ උච්චතම අවස්ථාව වනුයේ,
   (1) පන්දහසකට කෑම දීමය. (2) දුක් විඳීම, මරණය හා උත්ථානයයි.
   (3) ගෝලයන් තෝරාගැනීමය. (4) දේව මාළිගයේ පඬිවරුන් මැද දේශනා කිරීමය.

18. ජන වන්දනාවේ ප්‍රධාන අංගයන් වනුයේ,
   (1) දිව්‍ය පූජාව, සක්‍රමේන්තු, යාම යැදුම් ය.
   (2) දිව්‍ය පූජාව, සුව මෙහෙය, යාම යැදුම් ය.
   (3) දේව වාක්‍යයේ කොටස, පඬුරු පිදීම, විශ්වාසිකයින්ගේ යැදුම් ය.
   (4) යාම යැදුම්, පඬුරු පිදීම, ජපමාලය උච්චාරණය කිරීමය.

19. ගිහියා පමණක් දානය කරන සක්‍රමේන්තුව වනුයේ,
   (1) රෝගීන්ගේ ආලේපය (2) දිව්‍ය සත්ප්‍රසාදය
   (3) ආශිර්වාදකාර බන්ධනය (4) ප්‍රසාද ස්නාපනය

20. ස්වර්ග රාජ්‍යය උරුම වනුයේ,
   (1) බොරු නොකියන අයටය. (2) දිනපතා යාච්ඤා කරන අයටය.
   (3) තැන්පත්ව සිටින අයටය. (4) යුක්තිය උදෙසා පීඩා විඳින අයටය.

21. දේව රාජ්‍යයේ පදනම වනුයේ,
   (1) විශ්වාසය, ප්‍රඥාව හා දේව ප්‍රේමය ය. (2) විශ්වාසය, බලාපොරොත්තුව හා ප්‍රේමය ය.
   (3) දේව ප්‍රේමය, විශ්වාසය හා බලාපොරොත්තුවය. (4) විශ්වාසය, දේව ප්‍රේමය හා සමාව දීමය.

22. පාසල් වියේ පසුවන ඔබ විද්‍යාව දෙස බැලිය යුත්තේ කෙසේ ද?
   (1) විශ්ව ගම්මානයට පිවිසෙන දොරටුවක් ලෙසය.
   (2) මිනිස් ජීවිත සුඛිත මුදිත කරන්නක් ලෙසය.
   (3) මිනිස් ප්‍රයත්නයේ සාර්ථකත්වයක් ලෙසය.
   (4) මිනිසාට ලැබී ඇති ප්‍රඥාවේ ප්‍රසාරණය වීමක් ලෙසය.

23. පැවිදි චේදහාර වනුයේ,
(1) දිලිඳුකම, ව්‍රත ශුද්ධිය කීකරු කම. (2) දිලිඳුකම, කීකරුකම හා බැහැපත්කම.
(3) බඹසර රැකීම, කීකරුකම හා නිර්භීතකම. (4) නිර්භීතකම, කීකරුකම හා බැහැපත්කම.

24. සභාවේ ආරම්භක දිනය ලෙස සලකනුයේ,
(1) අහස් නැගි මංගල්‍යය දාය. (2) පෙන්තකොස්ත මංගල්‍යය දාය.
(3) පාස්කු මංගල්‍යය දාය. (4) ජයග්‍රාහී ලෙස ජෙරුසලමට ඇතුලුවූ දාය.

25. මගේ අසල්වැසියා කවුද යන පැනයට පිළිතුරු වශයෙන් ජේසුස් වහන්සේ විසින් වදාළේ,
(1) නාස්තිකාර පුත්‍රයාගේ උපමාවය. (2) වපුරන්නාගේ උපමාවය.
(3) ධනවතා හා ලාසරස්ගේ උපමාවය. (4) යහපත් සමරිතානුවරයාගේ උපමාවය.

26. ''රෝගීන්ට මිස නිරෝගීන්ට වෙදාගෙන් වැඩක් නැත.'' ජේසුස් වහන්සේ මෙයින් අදහස් කරනුයේ,
(1) දෙවියන් වහන්සේගේ අසීමිත ආදරය.
(2) රෝගීන්ට සුවය දානය කිරීම දෙවියන් වහන්සේ සතු බවය.
(3) දෙවියන් වහන්සේ පව්කාරයාට දක්වන අසීමිත දයාව.
(4) රෝගීහු සුවය පතා යාච්ඤා කළ යුතු බවය.

27. කිතුනුවන් යාච්ඤා කිරීමේ ප්‍රධාන අරමුණ වනුයේ,
(1) දෙවියන් වහන්සේ සමග ඇති සම්බන්ධතාව තහවුරු කර ගැනීමය.
(2) අපගේ පව්වලට පසුතැවිලි වීමය.
(3) දෙවියන්ගෙන් කැමැති දෙයක් ඉල්ලා ගැනීමය.
(4) ශුද්ධාත්මයින් ලෙස පෙනී සිටීමය.

28. ප්‍රශංසාව හා ඉල්ලීම අන්තර්ගත වී ඇති යාච්ඤාව නම්,
(1) උත්තම පූජක යාච්ඤාවය (2) යාම යැදුමය
(3) ස්වාමිවාක් ආරාධනාවය (4) තුන්කාල ආරාධනාවය

29. ක්‍රිස්තුන් වහන්සේ ජෝර්දාන් නදියේ ස්නාපනය ලැබූ අවස්ථාවේ ඇසුනු ප්‍රකාශනය,
(1) දිළිඳු වූ ඔබ භාග්‍යවන්තයෝය. මන්ද දෙවියන් වහන්සේගේ රාජ්‍ය ඔබගේය.
(2) ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය. ඔබ කෙරෙහි ඉතා ප්‍රසන්නව සිටිමි.
(3) මේ මාගේ පුත්‍රයාණෝය. මේ තෝරාගත් තැනැත්තාණෝය.
(4) අති උසස් තැන්හි දෙවිඳුට මහිමය ද, මිහිපිට දේව ප්‍රසාදය ලත් ජනයා අතර සාමය ද වේවා.

30. පුරාණ ගිවිසුම ඇති වූයේ,
(1) මෝසෙස් හා ඊශ්‍රායෙල් ජනතාව අතරය.
(2) දෙවියන් වහන්සේ සහ මෝසෙස් අතරය.
(3) ආදි මව්පියන් හා දෙවියන් වහන්සේ අතරය.
(4) දෙවියන් වහන්සේ සහ ඊශ්‍රායෙල් ජනතාව අතරය.

31. ශුද්ධ වූ බයිබලයේ මූලික අරමුණ වන්නේ,
(1) දේව රාජ්‍යය විස්තර කිරීමය. (2) දේව සංරක්ෂණය පෙන්වා දීමය.
(3) ගිවිසුම් ජීවිතය හඳුන්වා දීමය. (4) ඊශ්‍රායෙල් ඉතිහාසය ඉදිරිපත් කිරීමය.

32. සෑම මනුෂ්‍යකුටම ලැබී ඇති ස්වභාවික නියමය වන්නේ,
(1) මානව අයිතීන් රැක ගැනීමය. (2) අසල්වාසීන් ගැන සංවේදී වීමය.
(3) හෘද සාක්ෂිය අනුව ජීවත් වීමය. (4) තම කුසලතා දියුණු කර ගැනීමය.

33. රෝගීන්ගේ ආලේපය නමැති ප්‍රසාද නිධානය තුළින්,
(1) කායිකව හා මානසිකව ශක්තිමත් වේ.
(2) ක්‍රිස්තුන් වහන්සේගේ ගැලවීමේ කාර්යයට දායක වේ.
(3) ජීවිතයේ අවසානය ළඟා කර ගනී.
(4) ඔහු පෙළෙන රෝගයෙන් සුවය ලබා ගනී.

34. මිනිසා දෙවියන් වහන්සේ අත් දකිනුයේ,
(1) ස්වභාවික විපත් තුළිනි. (2) ශුද්ධ වූ ලියවිල්ල තුළිනි.
(3) සරු සාර අස්වැන්නක් ලැබීමෙනි. (4) භෞතික ලෝකය හා තම ජීවිතය තුළිනි.

The National e-learning Portal for the General Education

35. ජලයෙන් බෞතීස්ම නොලැබුවත් දේව රාජ්‍යයට පිවිසිය හැක්කේ කුමන අයටද?
(1) අන්‍ය ජාතිකයන්ට (2) වෙනත් සභාවකට අයිති වූවකුට
(3) විශ්වාසය වෙනුවෙන් දිවි පිදූ අයට (4) මනස්ථාපනය වූවකුට

36. දේව රාජ්‍යයේ වටිනාකම් ජේසුස් වහන්සේ අපට හඳුන්වා දුන්නේ,
(1) දසපනත මඟිනි. (2) ප්‍රේම පාරමිතාව මඟිනි.
(3) හාසරතයේ දේශනාව මඟිනි. (4) මංගල වාක්‍ය මඟිනි.

37. යහපත් පවුල් දිවියකට පරමාදර්ශයක් වන්නේ,
(1) ශුද්ධ වූ ත්‍රිත්වයයි. (2) දිව්‍ය හෘදයයි.
(3) ශුද්ධ වූ පවුලයි. (4) ක්‍රිස්තියානි පවුල් ව්‍යාපාරයයි.

38. විවාහ බන්ධනය ස්ථාපිත කරනු ලැබුවේ,
(1) මැවුම්කරුය. (2) විවාහ වන යුවලය. (3) ක්‍රිස්තුන් වහන්සේය. (4) පූජා ප්‍රසාදි තුමාය.

39. මුල් කිතුණු සභාවේ රොටී කැඩීමේ මෙහෙය අද අප පවත්වන්නේ,
(1) දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය තුළින්ය. (2) දිව්‍ය පූජාව තුළින්ය.
(3) කිතුණු ඒකක රැස්වීම තුළින්ය. (4) අසිපා සංවිධානය තුළින්ය.

40. ''ඔබේ සතුරන්ට ප්‍රේම කරන්න. ඔබට පීඩා කරන්නන් උදෙසා ......................'' හිස්තැනට සුදුසු වචනය වන්නේ,
(1) පීඩා කරන්න (2) වෛර කරන්න (3) යහපත කරන්න (4) යාච්ඤා කරන්න

## II - කොටස

- **පළමු ප්‍රශ්නය** ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

(01) (1) සුවදානයේ ප්‍රසාද නිධාන 02 ක් නම් කරන්න.
(2) ලංකා කතෝලික සාහිත්‍යයේ පියා යන විරුදාවලිය හිමිවන්නේ කාටද?
(3) ක්‍රිස්තියානි ජීවිතයේ ආරම්භක ප්‍රසාද නිධාන 02 ක් නම් කරන්න.
(4) අධෛර්ය නොවී නොකඩවා යාච්ඤා කළ යුතු බව දැක්වීමට ජේසුස් වහන්සේ වදාළ උපමාවක් නම් කරන්න.
(5) ඉශ්‍රායෙල් නමින් හඳුන්වනු ලබන්නේ කවුරුන්වද?
(6) තම පිරිසිදුකම වෙනුවෙන් ජීවිතය පූජා කළ ළමා ශුද්ධවන්තිය නම් කරන්න.
(7) ශුද්ධ වූ සභාවේ යාච්ඤා ප්‍රභේද තුන නම් කරන්න.
(8) මිනිසා තුළ පවතින අධ්‍යාත්මික ලක්ෂණ 03 ක් නම් කරන්න.
(9) ඊශ්‍රායෙල් ජනතාව පාරාවෝ රජු යටතේ කළ කර්මාන්ත 02 ක් නම් කරන්න.
(10) පව් කමාව අයදින යාච්ඤා දෙකක් නම් කරන්න.

(02) (1) ප්‍රසාද ස්නාපනයෙන් ඔබට ලැබී ඇති වරප්‍රසාද දෙකක් ලියන්න.
(2) ප්‍රසාද ස්නාපනයෙන් ඔබ ලැබූ නව ජීවිතය වර්ධනය කර ගැනීමට කළහැකි දෑ තුනක් ලියන්න.
(3) දේව වරප්‍රසාදයෙන් පිරිපුන් දරුවකු ලෙස සමාජය තුළ ඔබට කළ හැකි කාර්යයන් 05 ක් ලියන්න.

(03) (1) ජේසුස් වහන්සේගේ ජීවිතයේ ඔබ දකින පෞරුෂ ලක්ෂණ 02 ක් ලියන්න.
(2) සතුරාට ප්‍රේම කිරීම පිළිබඳව නව ගිවිසුමේ ඉගැන්වීම් තුනක් ලියන්න.
(3) ප්‍රේමයේ පනත ක්‍රියාත්මක කිරීමට ඔබට කළ හැකි දේ කරුණු 05 කින් ඉදිරිපත් කරන්න.

(04) (1) ශුද්ධාත්ම ඵල දෙකක් ලියන්න.
(2) අපෝස්තුළුවරුන් වෙත ශුද්ධාත්මයාණන් වහන්සේ වැඩම කිරීමේ සිද්ධිය කෙටියෙන් ලියන්න.
(3) ශුද්ධාත්මයාණන් ගෙන් ඔබට ලැබී ඇති දීමනා වලට ස්තුති කර යැදුමක් ලියන්න.

(05) (1) ක්‍රිස්තු අනුගාමිකයකු තුළ තිබිය යුතු විශේෂ ගුණාංග 04 ක් ලියන්න.
(2) හත්වන දේව පනත අනුව ජීවත් වීම සඳහා ඔබ අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති ඉදිරිපත් කරන්න.
(3) ''දේව රාජ්‍ය ඔබ අතරය'' යන අදහස අවබෝධ කරවීම සඳහා ඉදිරිපත් කරන කරුණු 05 ක් ලියන්න.

(06) පහත සඳහන් අය ගැන කෙටියෙන් හැඳින්වීමක් කරන්න.
(1) ජුසේවාස් පියතුමා (2) ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා
(3) මරිය තුමිය (4) තෙරේසා මව් තුමිය